සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade	10 ශ්‍රේණිය	කාලය / நேரம் / Time: පැය 03යි / வி. 10යி.

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I - II

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

සැලකිය යුතුයි:

- අමතර කියවීම් කාලය මිනිත්තු 10යි.
- අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා, තේරුම් ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය ලබා දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

උපදෙස් :

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක **(01)** සිට **(40)** තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් <u>නිවැරදි හෝ වඩාත් ගැළපෙන</u> පිළිතුර තෝරා ගෙන පිළිතුරු පත්‍රයේ (x) ලකුණ යොදන්න.

---

1. සන්නිවේදනයේ දී ආරම්භය සනිටුහන් කරන්නේ,

   (1) ග්‍රාහකයා (2) සන්නිවේදකයා (3) මාධ්‍ය (4) සංදේශය

2. නිර්වාචික සන්නිවේදනය ඉතා ප්‍රබල ලෙස හා කලාත්මක ලෙස භාවිත කළ හැකි ජනමාධ්‍ය වන්නේ,

   (1) පුවත්පත යි. (2) ගුවන් විදුලිය යි. (3) සිනමාව යි. (4) රූපවාහිනිය යි.

3. සිතුවිලි හා හැඟීම් මත සන්නිවේදනය සිදුවන්නේ,

   (1) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයේදී ය. (2) අන්තර් පුද්ගල සන්නිවේදනයේදී ය.
   (3) සමූහ සන්නිවේදනයේදී ය. (4) කථන සන්නිවේදනයේදී ය.

4. ජනමාධ්‍ය ආයතනයක හිමිකම අනුව ජනමාධ්‍ය ආයතන බෙදී යන්නේ,

   (1) රාජ්‍ය - පෞද්ගලික (2) විද්‍යුත් - මුද්‍රිත
   (3) ශ්‍රව්‍ය - දෘශ්‍ය (4) රජයට කොටස් හිමි සංස්ථාව

5. නිල ලිපි ශීර්ෂයක් සහිත ලිපියක් ඒ ආකාරයෙන් ම ඉක්මනින් හා පහසුවෙන් තවත් ස්ථානයක් වෙත යැවිය හැකි වන්නේ,

   (1) විද්‍යුත් තැපෑල මගිනි. (2) ෆැක්ස් යන්ත්‍රය මගිනි.
   (3) ඩිජිටල් කැමරාවෙනි. (4) ඡායා පිටපත් යන්ත්‍රය මගිනි.

Past Papers Wiki

6. කණ්ඩායමක සාමාජිකයකු වන ඔබගේ සන්නිවේදන හැකියාවට **අවම** ලෙස අදාළ වන්නේ,

(1) පුද්ගල පෙනුම හා පෞරුෂය යි. (2) අන් අය හා එක්ව සිටීමේ කැමැත්ත යි.

(3) තොරතුරු ඉදිරිපත් කිරීමේ කුසලතාව යි. (4) සන්නිවේදන කුසලතා පිළිබඳ විෂය දැනුම යි.

7. මුද්‍රණ ශිල්පය ආරම්භ කරන ලද්දේ,

(1) යුරෝපීයයන් ය. (2) අරාබි ජාතිකයන් ය.

(3) චීන ජාතිකයන් ය. (4) ඇමරිකානුවන් ය.

- පහත ප්‍රකාශ සැලකිල්ලට ගෙන 08 – 11 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - ප්‍රදීපාගාර උපක්‍රමය

B - නිර්වාචික සන්නිවේදනය ප්‍රබල වීම.

C - ප්‍රතිපෝෂණ ප්‍රමාද වීම.

D - ආත්ම භාෂණයට ප්‍රමුඛත්වය ලැබීම.

8. C ප්‍රකාශය අදාළ වන්නේ,

(1) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයට ය. (2) අන්තර් පුද්ගල සන්නිවේදනයට ය.

(3) ජන සන්නිවේදනයට ය. (4) සමූහ සන්නිවේදනයට ය.

9. සමූහ සන්නිවේදනය හා ගැළපෙන්නේ,

(1) B ය. (2) D ය. (3) C ය. (4) A ය.

10. මෙහි B ප්‍රකාශය වැඩිපුරම කැපී පෙනෙන්නේ,

(1) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය තුළ ය. (2) අන්තර් පුද්ගල සන්නිවේදනයට තුළ ය.

(3) ජන සන්නිවේදනය තුළ ය. (4) සමූහ සන්නිවේදනය තුළ ය.

11. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය හා ගැළපෙන්නේ,

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

12. ජනමාධ්‍ය ආයතනයක ප්‍රතිපත්ති සකස් කරනු ලබන්නේ,

(1) ග්‍රාහකයන් ය. (2) ජනමාධ්‍යවේදීන් ය.

(3) දැන්වීම් කරුවන් ය. (4) හිමිකරුවන් ය.

13. දේශනයක් අතරතුර කිසියම් පොතක ඇතුළත් රූප සටහනක් පෙර සූදානමකින් තොරව ග්‍රාහක පිරිස වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍යය වෙයි. ඊට ඔබ තෝරාගත යුත්තේ,

(1) ස්ලයිඩ් ප්‍රක්ෂේපණ යන්ත්‍රය. (2) ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රය.

(3) ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රය. (4) බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය.

14. පුවත්පත් මාධ්‍යයේ දී පිටපතක ඇති කරුණුවල නිරවද්‍යතාව, ලේඛන ශෛලිය හා ව්‍යාකරණ පිළිබඳ පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් වගකීම පැවරෙන්නේ,

(1) උපසංස්කාරකට ය.
(2) ප්‍රධාන සංස්කාරකට ය.
(3) ප්‍රවෘත්ති සංස්කාරකට ය.
(4) ප්‍රවෘත්ති වාර්තාකරුට ය.

15. ඔබ සිටින ස්ථානයේ දී ම රැඳී සිටිමින් මඳක් දුරින් පිහිටි වස්තුවක් සහ ඔබ සමීපයේ ඇති වස්තුවක් ඡායාරූපගත කිරීමට ඔබට අවශ්‍ය වේ. ඊට වඩාත් යෝග්‍ය වන්නේ,

(1) පුළුල් කෝණ කාචය යි.
(2) යුහුමු කාචය යි.
(3) සාමාන්‍ය කාචය යි.
(4) දුර රූප කාචය යි.

16. පාඩම අවසානයේ දී සිසුන්ට ඇති ගැටලු ඉදිරිපත් කිරීමට අවස්ථා ලබාදීම ගුරුතුමාගේ පුරුද්ද විය. මේ බව දත් සීතා එදින ද එම අවස්ථාව එළඹෙන තෙක් බලා සිටියා ය. මෙහි දී ඇය ප්‍රයෝජනයට ගන්නා සන්නිවේදන ක්‍රියාවලියට අයත් මූලිකාංගය වන්නේ,

(1) බලපෑම යි.
(2) අත්දැකීම් පසුතලය යි.
(3) සංදර්භය යි.
(4) ප්‍රතිපෝෂණය යි.

17. සේයා පටල සෑදී ඇත්තේ,

(1) රසදිය මගිනි.
(2) පොටෑසියම් හා ලවණ මගිනි.
(3) රිදී ලෝහය ලවණ සමග මිශ්‍රවීමෙනි.
(4) සෝඩියම් මගිනි.

18. පහත විධි ක්‍රම අතුරෙන් පුද්ගලාන්තර සන්නිවේදනයට ඇතුළත් **නොවීමට** ඉඩ ඇත්තේ කුමක් ද?

(1) ලිපියක් යැවීම.
(2) විද්‍යුත් තැපැල් ගිණුමක් ඇරඹීම.
(3) අතට අත දීම.
(4) කෙටි පණිවිඩ යැවීම.

19. ආවෘත පරිපථ රූපවාහිනීවල අරමුණ වන්නේ,

(1) සෘජුව නිවෙස් වෙත සේවා සැපයීම යි.
(2) අභ්‍යන්තර හා බාහිර පරිසර සුපරීක්ෂණය යි.
(3) දේශීය හා විදේශීය සේවා ලබාදීම යි.
(4) පසුගිය වැඩසටහන් නැරඹීමේ පහසුකම් සැපයීම යි.

- ප්‍රශ්න අංක 20 සිට 23 පිළිතුරු ලිවීමට පහත වගුව භාවිත කරන්න.

A	කවට කතිකයා
B	ලක්මිණි පහණ
C	ලංකාලෝකය
D	ඥානාර්ථ ප්‍රදීපය

W	කොග්ගල පඬිතුමා
X	මහජන සංවිධාන හිමි පුවත්පත්
Y	කතෘ හිමි පුවත්පත්
Z	ප්‍රථම සිංහල පුවත්පත

20. A ප්‍රකාශය ගැළපෙන්නේ,

(1) W (2) X (3) Y (4) Z

21. B ප්‍රකාශය ගැළපෙන්නේ,

(1) W (2) X (3) Y (4) Z

22. C ප්‍රකාශය හා ගැළපෙන්නේ,

(1) W (2) X (3) Y (4) Z

23. D ප්‍රකාශය ගැළපෙන්නේ,

(1) W (2) X (3) Y (4) Z

24. රූප සටහන මගින් සිදු කරන සන්නිවේදනය,



(1) වාචික මෙන්ම නිර්වාචික වේ.

(2) ලිඛිත, වාචික හා නිර්වාචික වේ.

(3) දෘශ්‍ය, ලිඛිත මෙන්ම වාචික වේ.

(4) වාචික හා නිර්වාචික මෙන්ම ලිඛිත හා දෘෂ්‍ය වේ.

25. රූපවාහිනිය නරඹමින් සිටි රමණීට රූප අපැහැදිලි වූයේ වැසි සහිත කාලගුණය නිසා ය. මෙය,

(1) අර්ථ බාධාවකි. (2) අර්ථ හා මාධ්‍ය බාධාවකි.

(3) මාධ්‍ය බාධාවකි. (4) පාරිසරික බාධාවකි.

26. ජනමාධ්‍ය ආයතනය අභ්‍යන්තර මාධ්‍යවේදීන්,

(1) මාණ්ඩලික මාධ්‍යවේදීන් වේ. (2) නිදහස් මාධ්‍යවේදීන් වේ.

(3) ප්‍රාදේශීය මාධ්‍යවේදීන් වේ. (4) පුරවැසි මාධ්‍යවේදීන් වේ.

27. මේ ප්‍රකාශ අතුරින් **සාවද්‍ය** ප්‍රකාශය වන්නේ,

(1) සංදේශය ප්‍රතිග්‍රහණය කර ගන්නා ග්‍රාහකයා ය.

(2) පුද්ගලාන්තර සන්නිවේදනයේ දී සන්නිවේදක - ග්‍රාහක භූමිකා හුවමාරු නොවේ.

(3) සන්නිවේදන බාධා ඇතොත් - වීවර් ආකෘතියෙන් මුලින් ම පළ කරන ලදී.

(4) ලැස්වෙල් ආකෘතිය රේඛීය ආකෘතියකි.

Past Papers Wiki

28. ඔබ නවකතා පොතක් කියවමින් සිටී. එහි සන්නිවේදන මූලිකාංගවල අනුපිළිවෙල කුමක් ද?

(1) සන්නිවේදකයා ⟶ පොත් ප්‍රකාශකයා ⟶ ග්‍රාහකයා

(2) සන්නිවේදකයා ⟶ පණිවිඩය ⟶ ග්‍රාහකයා

(3) පොත් ප්‍රකාශකයා ⟶ පණිවිඩය ⟶ ග්‍රාහකයා

(4) සන්නිවේදකයා ⟶ නාලිකාව ⟶ පණිවිඩය

29. ගුවන් නිවේදිකාවක් වන රේකා ට තම වෘත්තිය කරගෙන යාමට ඉවහල් වන සන්නිවේදන ස්වරූපය වන්නේ,

(1) විධිමත් සන්නිවේදනය යි.
(2) ජන සන්නිවේදනය යි.
(3) ශ්‍රව්‍ය සන්නිවේදනය යි.
(4) වාචික සන්නිවේදනය යි.

30. සේයා පටල යොදා ගන්නා කැමරා භාවිත කිරීමේ දී 'පටල වේගය' වැදගත් වේ. මින් අදහස් වන්නේ,

(1) ආලෝක සංවේදීතාව පිළිබඳව යි.
(2) ඉක්මනින් පින්තූර ගැනීමේ හැකියාවට යි.
(3) වේගයෙන් මානනය කළ හැකි බවයි.
(4) කඩිනමින් පටලය මාරු කළ හැකි බවයි.

31. සෙල්ලිපි සන්නස් මගින් සිදු කෙරෙන්නේ,

(1) නිර්වාචික මෙන්ම ලිඛිත සන්නිවේදනයකි.
(2) ලිඛිත මෙන්ම වාචික සන්නිවේදනයකි.
(3) වාචික මෙන්ම අලිඛිත සන්නිවේදනයකි.
(4) අලිඛිත මෙන් ම නිර්වාචික සන්නිවේදනයකි.

32. ජන සන්නිවේදනය **නිරවද්‍ය** ප්‍රකාශය වන්නේ,

(1) සන්නිවේදකයන් මාධ්‍ය තාක්ෂණය දැන ගත යුතු ය.
(2) සංදේශ පොදු නොවේ.
(3) ග්‍රාහකයන් පෞද්ගලිකව හඳුනති.
(4) ප්‍රතිචාර ප්‍රතිපෝෂණ සහිත ය.

33. වෙබ් අඩවි පිළිබඳ නොගැළපෙන ප්‍රකාශය වන්නේ,

(1) වෙබ් අඩවිය යනු විද්‍යුත් තොරතුරු ඇතුළත් ගොනුවකි.
(2) වෙබ් අඩවි පවත්වා ගෙන යාමට නියමිත මුදලක් ගෙවිය යුතු ය.
(3) ඕනෑම තැනක සිට අන්තර්ජාලය ඔස්සේ වෙබ් අඩවිවලට ප්‍රවේශ විය හැකි ය.
(4) වෙබ් අඩවිවලට ප්‍රවේශ වීමට බොහෝ විට මුර පදයක් අවශ්‍ය වේ.

34. රූපවාහිනී වැඩසටහනක දුටු දර්ශනීය ස්ථානයක් නැරඹීම සඳහා විනෝද ගමනක් යාමට සිතූ කමල් තම මිතුරු නිමල් හමුවී ඒ බව පැවසීය. එවිට නිමල් කියා සිටියේ දෙමව්පියන් හා සාකච්ඡා කළ යුතු බවය. මෙම අවස්ථාවට අදාළ සන්නිවේදන වර්ග අනුපිළිවෙල වන්නේ,

(1) ජන, අන්තර්වර්තී පුද්ගල, පුද්ගලාන්තර, සමූහ සන්නිවේදනය.
(2) අන්තර්වර්තී පුද්ගල, ජන, පුද්ගලාන්තර, සමූහ සන්නිවේදනය.
(3) ජන, පුද්ගලාන්තර, සමූහ, අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය.
(4) ජන, පුද්ගලාන්තර, අන්තර්වර්තී පුද්ගල, සමූහ සන්නිවේදනය.

Past Papers Wiki

35. ලැස්වෙල් සන්නිවේදන අර්ථ කථනය පිළිබඳ **සාවද්‍ය** ප්‍රකාශය කුමක් ද?

(1) සරල රේඛීය නොවේ. (2) ඒක මාර්ගිකයි.

(3) සන්නිවේදකයාට වැඩි සැලකිල්ලක් දක්වා ඇත. (4) බලපෑම පිළිබඳ අවධාරණය කොට ඇත.

36. ඡායාරූපයක විභේදන බලය යනු,

(1) වර්ග අගලක් තුළ පික්සල් ප්‍රමාණය යි. (2) ක්ෂේත්‍ර ගැඹුර අඩු වැඩි කිරීමේ හැකියාව යි.

(3) පටල වේගයේ අඩු වැඩි බව යි. (4) ආලෝක අනාවරණ කාලය යි.

37. ප්‍රතිපෝෂණය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ග්‍රාහක ප්‍රතිචාර ආකේතකරය වෙත ළඟාවීම අත්‍යවශ්‍ය නොවේ.

(2) රේඛීය සන්නිවේදන ක්‍රියාවලියේ දී දෘශ්‍ය වන තත්වයකි.

(3) සන්නිවේදක කේන්ද්‍රීය තොරතුරු හුවමාරු ක්‍රියාවලියකි.

(4) කථන හෝ ලිඛිත සන්නිවේදනයට ලඝු වූවක් නොවේ.

38. ඔබගේ පන්ති කාමරය තුළ භාවිත වන ප්‍රක්ෂේපණය යන්ත්‍රයක ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A - යන්ත්‍රය තුළ අධි බලැති විදුලි බුබුලක් භාවිත වේ.

B - වර්ණ රූප ප්‍රක්ෂේපණය කරයි.

C - විනිවිදක රූප රාමු යොදා ගනී.

මෙම ලක්ෂණ අදාළ වන්නේ,

(1) ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රයට ය. (2) කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රයට ය.

(3) ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රයට ය. (4) බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රයට ය.

39. ෂැනොන් - වීවර් ආකෘතිය හා නොගැළපෙන වරණය වන්නේ,

(1) ගණිතමය ආකෘතිය යි. (2) බාධා හඳුන්වා දී ඇත.

(3) ඒක මාර්ගික යි. (4) ප්‍රතිපෝෂණ පවතී.

40. එක් අයකු කේන්ද්‍ර කොට ගෙන වැඩි දෙනෙක් වෙත පණිවිඩය පැතිර යන විධිමත් සන්නිවේදන ආකෘතිය

(1) චක්‍රීය (2) දාම (3) වයි (4) රෝද

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library

Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	කාලය நேரம் Time
10 ශ්‍රේණිය	

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

B කොටස - රචනා

- **පළමුවැනි** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ද ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

1) ජනමාධ්‍යයන් සමාජයට අත්‍යවශ්‍යම අංගයක් වී ඇත්තේ එමඟින් තොරතුරු සම්පාදන කාර්යය හා විනෝදාස්වාද කාර්යය ඉටුවන නිසා ය.
   (i) ජනමාධ්‍ය යන්නට නිදසුන් දෙකක් ලියන්න.
   (ii) ඔබ දන්නා රජයට කොටස් හිමි විද්‍යුත් මාධ්‍ය දෙකක් නම් කරන්න.
   (iii) ජනමාධ්‍ය මඟින් සිදුවන සෘණාත්මක බලපෑම් දෙකක් නම් කරන්න.
   (iv) ජනමාධ්‍යයේ ප්‍රවෘත්ති නිවේදකයා භාවිත කරන සන්නිවේදන ස්වරූපය කුමක් ද?
   (v) එම සන්නිවේදන ස්වරූපය සාර්ථකත්වය සඳහා භාවිත කළ යුතු භාෂා කුසලතා තුනක් නම් කරන්න.
   (vi) ජනමාධ්‍ය වෙත ප්‍රතිපෝෂණයන් ලබා දිය හැකි ආකාර දෙක නම් කරන්න.
   (vii) අන්තර්ජාලය පැමිණීම නිසා සියලු මාධ්‍ය එකට හමුවේ. මෙම සංකල්පය කිනම් නමකින් හැඳින්වේ ද?
   (viii) ජනමාධ්‍යය තොරතුරු සම්පාදනයේ දී තොරතුරු පාලනය කිරීම හඳුන්වන නම කුමක් ද?
   (ix) විනෝදාත්මක කාර්යය ඉටු කිරීමට ගුවන් විදුලියේ ප්‍රචාරය වැඩසටහන් දෙකක් නම් කරන්න.
   (x) රූපවාහිනියේ ටෙලිනාට්‍යයක ශිල්පිනියකගේ දුක්බර අවස්ථාවක ඇසේ කඳුළු ප්‍රේක්ෂකයාට දිස් විය. එහි දී කැමරා ශිල්පියා භාවිත කළ කැමරා කෝණය නම් කරන්න.

2) (i) ලැස්වෙල් අර්ථ කථනය ලියා දක්වන්න.
   (ii) විද්‍යුත් තැපෑල මඟින් සිදුවන වාසි හතරක් ලියා දක්වන්න.
   (iii) සන්නිවේදන අරමුණු තුනක් පහදන්න.
   (iv) දේශකයෙක් දේශනයක දී භාවිත කරන නිර්වාචික සන්නිවේදන ක්‍රම හතර පහදන්න.

3) (i) ව්‍යාජ මුදල් නෝට්ටු හඳුනා ගැනීමට අදාළ කාර්යාලයීය මාධ්‍ය උපකරණය කුමක් ද?
   (ii) වෙබ් අඩවියක් පවත්වාගෙන යාමේ වාසි දෙකක් නම් කරන්න.
   (iii) දුරකථන සංවාදයක පිළිපැදිය යුතු ආචාරධර්ම තුනක් පහදන්න.
   (iv) මාධ්‍ය ක්‍රියාකාරීත්වය පාලනය කිරීමට රජයෙන් පැන වූ මැදිහත්වීම් හතරක් පහදන්න.

Past Papers Wiki

4) (i) ඡායාරූප අයත් වන සන්නිවේදන ස්වරූපය කුමක් ද?

(ii) ඡායාරූපය වැදගත් වන්නේ ඇයි දැයි කරුණු දෙකක් මගින් දක්වන්න.

(iii) වෘත්තීය ඡායාරූප ශිල්පියෙකු අනුගමනය කළ යුතු ආචාර්ය ධර්ම තුනක් විස්තර කරන්න.

(iv) පහත කාව වර්ග කෙටියෙන් හඳුන්වා උදාහරණ එක බැගින් ලියන්න.

A - සාමාන්‍ය කාචය

B - දුර රූප කාචය

C - පුලුල් කෝණ කාචය

D - යුහුමු කාචය

5) (i) පටල වේගයෙන් දැක්වෙන්නේ කුමක් ද?

(ii) ප්‍රධාන සන්නිවේදන බාධා දෙක නම් කරන්න.

(iii) සන්නිවේදන මූලිකාංග තුන පහදන්න.

(iv) ජනමාධ්‍යය් ධනාත්මක බලපෑම් හතර පහදන්න.

6) (i) පුරවැසියෙකුගේ ලක්ෂණ දෙක නම් කරන්න.

(ii) වාචික සන්නිවේදන කුසලතා හතර නම් කරන්න.

(iii) ඵලදායි ලේඛනයක ලක්ෂණ තුන පහදන්න.

(iv) විධිමත් සන්නිවේදන ලක්ෂණ හතරක් පහදන්න.

7) (i) එක් අයෙකුගෙන් බොහෝ දෙනාට ආදී වශයෙන් තොරතුරු පැතිරේ. මෙය අයත් වන්නේ කිනම් අවිධිමත් දාමයට ද?

(ii) සංජානන බාධා දෙක නම් කරන්න.

(iii) පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලියේ වාසි තුන පහදන්න.

(iv) A - තැපැල් මුද්‍රා යන්ත්‍රය

B - නිල මුද්‍රාව

C - ෆැක්ස් යන්ත්‍රය

D - පරිගණකය

E - පියවූ පරිපථ රූපවාහිනී කැමරා

F - විද්‍යුත් පිරික්සුම් උපකරණ

G - පේජරය

ඉහත උපකරණ අතුරින් තොරතුරු හුවමාරු කිරීමේ මාධ්‍ය උපකරණ හතරක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library